# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2019

2025 - ජූලි

**BCOM E 3015 - මානව සම්පත් කළමනාකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයයි : (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) කට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ). මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන ශ්‍රිතයන් හඳුනාගෙන ඕනෑම සතරක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ආ). මානව සම්පත් ප්‍රධාන ශ්‍රිතයන් ඵලදායී ලෙස භාවිතා කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ). තිරසාර තරඟකාරී වාසියක් ලබා ගැනීම සඳහා උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය (SHRM) විසින් වටිනා, දුර්ලභ, අනුකරණය කළ නොහැකි සහ ආදේශ කළ නොහැකි (Valuable, Rare, Inimitable, and Non-substitutable - VRIN) ) සම්පත් සහ හැකියාවන් සපයන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක - 02**

අ). මානව සම්පත් සැලසුම්කරණය (HRP) නිර්වචනය කර මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියට අන්තර්ගත ප්‍රධාන පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ). කාර්ය විශ්ලේෂණයේ ප්‍රධාන සංරචක වන කාර්ය විස්තරය සහ කාර්ය පිරිවිතර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ). බඳවාගැනීම්, පුහුණුව සහ කාර්ය සාධන ඇගයීම වැනි අනෙකුත් HRM කාර්යයන්හි කාර්ය විශ්ලේෂණ දත්ත භාවිතා කරන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 03

අ). 'බඳවාගැනීම' යන පදය නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ආ). 'අභ්‍යන්තර ආකර්ෂණ ප්‍රතිපත්තිය' සහ 'බාහිර ආකර්ෂන ප්‍රතිපත්තිය' සසඳන්න.

(ලකුණු 04)

ඇ). සම්මුඛ පරීක්ෂණයක් අතරතුර සම්මුඛ පරීක්ෂකයෙකුට මුහුණ දිය හැකි ගැටළු තුනක් එක් එක් සඳහා සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඈ). බඳවාගැනීම් ක්‍රියාවලියේ ආකෘතිය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 04

අ). 'පුහුණුව' සහ 'සංවර්ධනය' යන පද නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ආ). කාර්ය ස්ථානයේ පුහුණුව (On the job training) සහ කාර්ය ස්ථානයෙන් බැහැර පුහුණුව (off the job training) අතර වෙනස්කම් මොනවාද?

(ලකුණු 05)

ඇ). පුහුණුව සහ කාර්ය සාධන ඇගයීම අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. ඒ සමඟම ඵලදායී පුහුණු සැසියක් පැවැත්වීම සඳහා මාර්ගෝපදේශ හතරක් හඳුනා ගන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 05

අ). වන්දි යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

ආ). වන්දි සන්දර්භයේ සමතුලා සිද්ධාන්තය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ). වන්දි සහ කාර්ය සාධන ඇගයීම අතර සම්බන්ධතාව විස්තර කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක - 06

පහත මාතෘකා සම්බන්ධව කෙටි සටහන් ලියන්න:

අ). ගැටළු විසදීමේ සම්මුඛ පරීක්ෂණය (Problem-Solving Interview)

ආ). මෘදු මානව සම්පත් කළමනාකරණය (Soft HRM)

ඇ). කම්කරු සෞඛ්‍ය සහ ආරක්ෂාව

ඈ). කම්කරු සම්බන්ධතා

ඉ). කම්කරු පිරිවැටුම්

(එක් මාතෘකාවකට ලකුණු 04 බැගින් — **මුළු ලකුණු 20)**